# පළාත් සභා ඡන්ද කල් දැමීමට වඩා කොටස් ලෙස පැවැත්වීමත් හොඳයි – පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

2:00, Aug 16 2017



**20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළහොත් ඊට එරෙහිව විරෝධතා පෙත්සම් 10ක් ඉදිරිපත් කිරීමට පැෆරල්, කැෆේ ඇතුළු සිවිල් සංවිධාන සහ දේශපාලන පක්ෂ සැලසුම් කර තිබේ. මේ එම සංශෝධනයේ අරමුණු, ඊට එරෙහි වීමට බලපෑ හේතු සහ දිගින් දිගට ම මැතිවරණ කල් දැමීම පිළිබඳ පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සමග රිවිර කළ සාකච්ඡාවකි.**

**නව ආණ්ඩුව යටතේ තවත් කොමිෂන් සභා කිහිපයක් සමග ස්වාධීන මැතිවරණ කොමිසම් සභාව පිහිටු වූවා. එහි අරමුණ වූයේ කුමක් ද?**

ඔව්, නව ආණ්ඩුව පිහිට වූ පසු යම් සාධනීය කරුණු කිහිපයක් ඉටු වුණා. එකක් තොරතුරු දැනගැනීමේ පනත. එය ඉතාම බලගතු පනතක්. මේ රටේ අල්ලස දූෂණය වංචාව පිටු දකින්න ඉන් විශාල ප්‍රයෝජනයක් ගත හැකියි. නමුත් තවම එය අපි මැනවින් භාවිත කරන්නේ නෑ.

ඒ වගේ ම 19 වන සංශෝධනය යටතේ පොලිස් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම වගේ කොමිෂන් සභා ස්ථාපිත කිරීමත් වැදගත්. ස්වාධීන මැතිවරණ කොමිසම නිර්මාණය වුණෙත් ඒ යටතේ. රටේ මැතිවරණ දේශපාලන සහ බාහිර අත පෙවීම්වලින් තොරව ස්වාධීන ලෙස පැවැත්විය හැකි පදනමක් සැකසීම තමයි මැතිවරණ කොමිසම පිහිටු වීමේ අරමුණ.

එහෙත් එම කොමිසමට මැතිවරණ සම්බන්ධව කෙතරම් ස්වාධීනව කටයුතු කළ හැකි ද යන්න බරපතළ ගැටලුවක්. ඉන්දියානු මැතිවරණ කොමිසමට නම් මැතිවරණ ක්‍රියාවලිය අතරතුර අවශ්‍ය නීති සම්පාදනය කිරීමේ බලයත් තියෙනවා.

මැතිවරණ කොමිසමට මැතිවරණ දිනය ප්‍රකාශයට පත් කිරීමට ඇති අයිතිය පවා 20 වන සංශෝධනය ඔස්සේ පාර්ලිමේන්තුවට පවරා ගැනීමට උත්සාහ කරනවා. 19 වන සංශෝධනය යටතේ කොමිෂන් සභා ස්ථාපිත කළ ආණ්ඩුව මෙය කිරීමට සූදානම් වීම තමයි ඛේදවාචකය. එය වැරදි පූර්වාදර්ශයක්. ආණ්ඩුවේ වගකීම ස්වාධීන කොමිෂන් සභාවලට අවශ්‍ය බලය ලබා දීම මිසක් ඒ බලතල උදුරා ගැනීම නෙමේ.

මැතිවරණ කොමිසමේ වගකීම මැතිවරණයක් ප්‍රකාශයට පත් වූ පසු එය ස්වාධීනව හා නිදහස් ලෙස පැවැත් වීම පමණක් නෙමේ. නියමිත කාලයට කැලන්ඩරයකට අනුව මැතිවරණ පැවැත්වීමේ බලයත් මැතිවරණ කොමිසමට හිමි විය යුතුයි.

**මැතිවරණ දෙපාර්තමේන්තුව මැතිවරණ කොමිසම බවට පත් වීමේ වාසි මොනවා ද?**

ඔව්, මැතිවරණ කොමිසම පිහිට වූ පසු මැතිවරණ කටයුතු පිළිබඳ පාසල් සිසුන්, තරුණයන් සහ ජනතාව දැනුම්වත් කිරීමේ ක්‍රියාවලිය, ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය දැන් ගමට ගෙනැවිත් තියෙනවා. එය හොඳ තත්ත්වයක්. ඒ යටතේ සාධනීය කටයුතු රාශියක් සිදු වෙමින් පවතිනවා. හැබැයි කොමිසමේ මූලික වගකීම මැතිවරණ පැවැත් වීම.

**දැන් පළාත් පාලන මැතිවරණය වසර දෙකකට වඩා කාලයක් ප්‍රමාද වෙලා. මැතිවරණ පැවැත් වීම සඳහා එම කොමිසමට මැදිහත් වෙන්න බැරි ද?**

නව පළාත් පාලන මැතිවරණය එන්නේ අලුත් පනත යටතේ. පැර, ක්‍රමයට නම් මැතිවරණ කොමසාරිස්ට මැතිවරණ ප්‍රකාශයට පත් කරන්න බලය තිබුණා. අලුත් පනතේ නීතිමය සංශෝධන සපුරන තුරු යම් බාධාවක් තියෙනවා. මැතිවරණ කොමිසමට නීතිමය රාමුව තුළ මැතිවරණ පැවැත්වීමට බලපෑම් කිරීමට හැකියාවක් තිබිය යුතුයි. අවාසනාවට ඒ නීතියමය රාමුව අපට නෑ.

නමුත් මැතිවරණ කොමිසම මේ ගැන සිය මතය දැන් ප්‍රකාශයට පත් කරලා තියෙනවා. එහි සභාපතිවරයා ඇතුළු සියලු දෙනා මැතිවරණ කල් දැමීම ප්‍රජාතන්ත්‍රවාදයට හානියක් බව ප්‍රකාශ කොට තිබෙනවා. පහුගිය අගෝස්තු 4 වන දා මැතිවරණ කොමිසම දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමග පැවැත් වූ රැස්වීමක දී මැතිවරණ කල් දැමීම ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පැහැර ගැනීමක් බවත් එලෙස මැතිවරණ කල් දැමිය නොහැකි බවත් ප්‍රකාශ කොට තිබෙනවා. ඒ වගේම

එය ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්ම බරපතළ ලෙස උල්ලංඝනය කිරීමක් ලෙස ඔහු අර්ථ දක්වනවා. මේ ප්‍රකාශය ඉතාම බරපතළයි. ආණ්ඩුව ඒවාට මොන තරම් ඇහුන් කන් දෙනවාද යන්න ප්‍රශ්නයක්. මෙය අනාගතයට වැරදි පූර්වාදර්ශයක්.

**පාර්ලිමේන්තුවට ගෙන ඒමට නියමිත 20 වන සංශෝධනයේ අන්තර්ගතය කුමක්ද?**
මෙහි ඇත්තේ ඉතා ම සරල සංශෝධන කිහිපයක්. මේ යටතේ මෙතෙක් මැතිවරණ කොමිෂන් සභාවට පැවති පළාත් සභා මැතිවරණ දින තීන්දු කිරීමේ බලය පාර්ලිමේන්තුවට පවරා ගැනීමට යෝජනා කරනවා. සියලූ පළාත් පාලන මැතිවරණ එක ම දිනයක පැවැත් වීම සඳහා යෝජනා කරන අතර ඒ දිනය පාර්ලිමේන්තුව විසින් නිශ්චය කළ යුතු බවත් සඳහන් වෙනවා. ඒ වගේ ම කිසියම් හේතුවක් නිසා යම් පළාත් සභාවක් නියමිත දිනට කලින් විසුරුවා හැරීමට සිදු වුණොත් එය පාර්ලිමේන්තුව යටතට පත්වෙනවා.

රටේ මැතිවරණ කොමිසමේ බලතල පාර්ලිමේන්තුවට පවරා ගැනීමත් බරපතළ වරදක්. විසිරුණු පළාත් සභා බලතල පාර්ලිමේන්තුවට පවරා ගැනීම පවරා ගැනීම 13 වන සංශෝධනයට පටහැ,යි. මෙතෙක් පැවතියේ පළාත් සභාවට නියෝජිතයන් පත් කරලා  වසර 5කට පසු ස්වාභාවික ම විසිරී යාම. ජනතාව නිශ්චිත කාලයකට පළාත් සභාවට පත් කළ නියෝජිතයෝ ජනතා කැමැත්තකින් තොරව පාර්ලිමේන්තුව දීර්ඝ කිරීම නැත්නම් තීරණය කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධීයි.

**එහෙත් සියලූ පළාත් සභා මැතිවරණ එක දිනයක පැවැත් වීමේ යෝජනාව හොඳයි නේද?**
ඔව්, සියලූ පළාත් සභා මැතිවරණ එක දිනයක පැවැත් වීම සාධනීයයි. අපි ඒ පිළිබඳ අවුරුදු ගණනාවක් තිස්සේ හ~ නැගුවා. රටේ ම මැතිවරණයක් පවත් වන විට මැතිවරණ දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන තුන් හාර දාහක් යනවා. මැතිවරණ කෑලි කඩලා වසර පුරා පැවැත්වීම නිසා ඒ සඳහා මිලියන පන් හය දහසක් යනවා. සමහර වියදම් රටේ ම මැතිවරණය තිබ්බත් පළාතක තිබ්බත් දැරිය යුතුයි. නිදසුනකට මැතිවරණයක් සඳහා නිල වශයෙන් පළ කළ යුතු පුවත්පත් දැන්වීම් පළාතක මැතිවරණ තිබ්බත් රටේම මැතිවරණ තිබ්බත් පළ කළ යුතුයි. ඒ වියදම දැරිය යුතුයි. එමගින් සිදු වන විශාල මුදල් නාස්තියක් නතර වෙනවා. එකවර මැතිවරණ පැවැත්විය හැකි නම් විශාල සම්පත් ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකියි.

ඒ වගේ ම වසර පුරා මැතිවරණ පවත් වන විට රටේ සංවර්ධනයට යෙදවිය යුතු කාලය මැති ඇමතිවරු සිය පක්ෂයේ, ආසනයේ මැතිවරණ ජයග්‍රහණය සඳහා යොදවනවා. ඒ වගේම ආණ්ඩු පක්ෂය සමස්ත රාජ්‍ය බලය සහ සම්පත් එක පළාතක මැතිවරණ ජයග්‍රහණය සඳහා යොදා ගන්නවා. විපක්ෂයත් සිය උපරිම බලය යොදවනවා. ඒ නිසා ජනතාවට ස්වාධීන තීන්දුවක් ගැනීමේ අවස්ථාව අහිමි වෙනවා.

කොටස් වශයෙන් මැතිවරණ තබන විට ජනතා මතයට එය බලපානවා. සබරගමුව පළාත් සභා මැතිවරණය මුලින් තියලා අනතුරුව උතුරු මැද පළාත් මැතිවරණය තබන විට සබරගමුවේ ප්‍රතිඵලය උතුරු මැද ඡන්දදායකයන්ගේ ඡන්ද භාවිතාව කෙරෙහි බලපානවා. ඒ නිසා කෑලි කෑලි

මැතිවරණ තැබීම ප්‍රජාතාන්ත්‍රික නෑ. ඒ නිසා එකවර මැතිවරණ පැවැත්වීම හොඳයි. හැබැයි එකම දිනයක මැතිවරණ තැබීම කියන කාරණය පදනම් කරගෙන මැතිවරණ කල් දැමීමට වඩා කොටස් කොටස් හෝ මැතිවරණ තැබීම හොඳයි.

**20 වන සංශෝධනය ගෙන ඒමේ අරමුණ කුමක්ද?**

පළාත් පාලන මැතිවරණය කල් දමන පසුබිමක තමයි 20 වන සංශෝධනය ගෙන එන්නේ. ආණ්ඩුව මෙතෙක් ප්‍රදර්ශනය කරලා තියෙන්නේ තමන්ට මැතිවරණ පැවැත්වීමේ වුවමනාවක් නෑ කියලා. එවැනි පසුබිමක මේ සංශෝධනය ගෙන එන්නේ පළාත් සභා මැතිවරණ කල් දැමීමේ යටි අරමුණ ඇතිව බවට ඇති චෝදනා බැහැර කරන්න බෑ.

ආණ්ඩුව සද්භාවයෙන් කටයුතු කරනවා නම් මුලින් ම විසුරුවාලීමට නියමිත පළාත් සභාවේ අවසාන දිනයට අදාළව සෙසු සියලු පළාත් සභා විසුරුවා මැතිවරණය එකවර පැවැත්විය හැකියි. නැතිනම් සියලූ පළාත් සභා විසිරෙන තුරු නොසිට අතරමැදි දිනයක මැතිවරණ පැවැත්විය හැකියි. ඒ වගේ ම පළාත් සභා මැතිවරණ එක ම දිනයක පැවැත්වීමේ පනත සිය කාලය තුළ ගෙන ආ යුතුයි කියලා ආණ්ඩුව හිතනවා නම් එය මේ පළාත් සභාව විසුරුවා හැර මැතිවරණ පවත්වා පත් කර ගන්නා අලූත් පළාත් සභාවට බලපාන ආකාරයට ගෙන ආ හැකියි. එවිට ප්‍රමාදයක් නැතිව මේ පළාත් සභා මැතිවරණය පැර, ක්‍රමයට ම පැවැත්විය හැකියි.

**දිගින් දිගට ම මැතිවරණ ප්‍රමාද වීම නිසා සමාජයට වන බලපෑම කුමක්ද?**

කලින් ආණ්ඩුව පැවති සමයේ හැමදාම කෑලි කෑලි මැතිවරණ තිබුණා. එහි උපරිම වාසිය ඒ ආණ්ඩුව ගත්තා. රාජ්‍ය බලය, දේපළ භාවිත කළා. ඡන්දදායකයාට විවිධ අල්ලස් ලබා දුන්නා. ඒ මොනවා වුණත් ඡන්දපොළේ දී ජනතාවට තමන්ට කැමති පුද්ගලයා තෝරා ගන්න අවස්ථාව තිබුණා. මොකද ආණ්ඩුවේ කෙනෙක් ඇවිත් ඡන්ද පත්‍රිකාව ලකුණු කළේ නෑ. ඒ නිසා තමයි බල හුවමාරුවක් වුණේ.

නමුත් මැතිවරණ කල් දැමීම නිසා ජනතාවට තිබුණු ඒ අයිතිය සම්පූර්ණයෙන් ම අහිමි කරලා. ඒ ආණ්ඩුව යටතේ තිබුණු අයිතිය පවා අද අහිමි වෙලා. ජනතාවට තමන්ගේ නියෝජිතයා තෝරා ගන්න ඇති ප්‍රජාතන්ත්‍රවාදී ඉඩ අහිමි කිරීම නිසා ජනතාව වෙනත් විකල්ප කරා යන්න පුළුවන්. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි පවතින විශ්වාසය නැති වෙනවා. 71 සහ 88-89 කාලේ තරුණයන් අසහනයට පත් වුණේ ඔවුන්ගේ අදහස් ප්‍රකාශයට පත් කරන්න ක්‍රමයක් නොතිබුණු නිසායි. එවිට ජනතාව නීතිය අතට ගන්න පුළුවන්. ඒ වගේ ම මැතිවරණ කල් දැමීම නිසා පළාත් පාලන ආයතන අක්‍රීය වීම නිසා ජනතා අවශ්‍යතා නිසි ලෙස ඉටු නොවන තත්ත්වයක් ඇති වෙලා. පසුගිය ගං වතුර, නියඟය හමුවේ ජනතාව වඩාත් අසරණ වුණේ පළාත් පාලන ආයතන අක්‍රිය වූ නිසායි.

**සාකච්ඡා කළේ:නාමල් උඩලමත්ත**